## 367 ආලෝකයේ දරුවෝ

ආලෝකයේ දරුවෝ වමු අපි
සමිඳුන් කී විලසින්
ආලෝකයේ දරුවෝ වමු අපි

තම විශ්වාසය තර කරමින්
කිතු සමිඳුන් තුළ පෙම් වඩමින්
බලාපොරොත්තුව ඇති කර ගන්නට ආරාධනා //

මිසදිටු අදහස් දුර හරිමින්
සැබෑ දහම් හර පිළිගනිමින්
කිතු හිමි පෑ මඟ පියමං කරනට ආරාධනා //

තමකම මුලිනු'පුටා දමමින්
අනුනට දයාව පතුරුවමින්
කරුණා ගුණයෙන් පිරිපුන් වන්නට ආරාධනා //

ගුරු දෙගුරුන් හට ගරු කරමින්
වැඩිහිටියන් අණ පිළිපදිමින්
සිය ජීවන මග සරුකර ගන්නට ආරාධනා //

පවුලේ සමගිය රැක ගනිමින්
තම සතු යුතුකම් ඉටු කරමින්
දින දින දියුණුව වෙත එළඹෙන්නට ආරාධනා //

රට දැය සමයට හිත යොදමින්
සේවය හරිහැටි ඉටු කරමින්
මතු පරපුර වෙනුවෙන් වැය වන්නට ආරාධනා //